# මුස්ලිම් විවාහ හා දික්කසාද පනත සහ සංශෝධන පිළිබඳව බහුලව අසන ප්‍රශ්න

## 1 මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත යනු කුමක්ද?

ශ්‍රී ලංකාවේ 1907 විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥාපනත[1] රටේ සියලුම පුරවැසියන්ට අදාල වන අතර ආගම තුළ විවාහවන මුස්ලිම් පුරවැසියන්ට එය අදාල නොවේ.[2] ප්‍රජාවන් කොට්ඨාශ දෙකකට - උඩරට සිංහල සහ ශ්‍රී ලාංකික මුස්ලිම් ප්‍රජාවන්ට ජනවාර්ගිකත්වය (භූගෝලීය සීමාවන් සහිත), සහ ආගම මත පදනම්ව විවාහ සහ දික්කසාද සඳහා වෙන් වූ පනත් ඇත. වත්මන් මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත 1951 වසරේදී නීතිගත කරන ලදී.

උඩරට සිංහල ප්‍රජාවට 1952 උඩරට විවාහ සහ දික්කසාද පනත මෙන්ම විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ විවාහවීමේ විකල්පය ඇත. කෙසේවෙතත් මුස්ලිම් ප්‍රජාවට මෙම විකල්පය නොමැත. ඒ මුස්ලිම් පුරවැසියෙකු තවත් මුස්ලිම්වරයෙකු (ඉස්ලාම් ආගම වැළඳගත් අයද ඇතුළත්ව) සමඟ විවාහ වීමේදී 1951 මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත පමණක් බලපාන නිසාවෙනි. එහෙත් මුස්ලිම්වරුන්ට වෙනත් ජනවර්ගයක හෝ ආගමක සහකරුවෙකු විවාහකර ගැනීමට විවාහ (සාමාන්‍ය) ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ අවසර ඇත. ශ්‍රී ලංකාවේ මුස්ලිම් ජාතිකයන් සියයට 9.66 සිටිති. (එය රටේ සමස්ථ ජනගහනයෙන් 1,967,523 පිරිසකි.)3

## 2 මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතෙහි මූලාරම්භය කුමක්ද?

ශ්‍රී ලාංකික මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතෙහි මූලාරම්භය 1770 ලන්දේසි පාලන සමයේදී බටාවියාවෙන් (වර්තමාන ඉන්දුනීසියාව) ගෙනෙන ලද විවාහ සහ දික්කසාද නීති සංග්‍රහයයි. 1806 සහ 1951 අතර කාලය තුළදී මෙම නීති සංග්‍රහය සංග්‍රහගත කිරීමේ, සමාලෝචනය සහ සංශෝධනය කිරීමේ ක්‍රියාවලියකට බඳුන් වූ අතර, ඒ සෑම අවස්ථාවකදීම එවකට ප්‍රමුඛ නීති සහ ආගමික පුද්ගලයන් කිහිපදෙනෙකුගේ ප්‍රධානත්වයෙන් එය සිදු කරන ලදී.

වර්තමාන පනතට මීට පෙර තිබූ ආඥා පනත් සහ සංග්‍රහයන්හි පැවැති හරයාත්මක විධිවිධාන මෙන්ම ෂරියා නීතිය හා ඉස්ලාමීය නෛතික භාවිතයන් පදනම්කරගත් විධිවිධානද අන්තර්ගත වේ. එහෙත්, මෙම පනතට එවකට මුස්ලිම් ප්‍රජාව විසින් අනුගමනය කරන ලද කෛයිකූලී (මනාලියගේ පාර්ශවය විසින් මනාලයාට දෙනු ලබන දෑවැද්ද) ආදී ඉස්ලාමීය නීතියට ආගන්තුක, දේශීය සංස්කෘතියට අදාල චාරිත්‍රයන්ද ඇතුළත් වේ. සමහර ආගමික ඉගැන්වීම්වලට අනුව ඉස්ලාම් ආගමෙහි කෛයිකූලි හරාම්/තහනම් ලෙස සැලකේ.

### *ෂරියා නීතිය මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතෙහි පදනම වන්නේද?*

බහුල වශයෙන් ඉස්ලාම් ආගමෙහි මුල් සියවස් තුනෙහි කාල පරිච්ඡේදය තුළදී මුස්ලිම් නීතිවේදීන් විසින් ඓතිහාසික වශයෙන් තේරුම්ගත් සහ ගොඩනංවන ලද ඉස්ලාමීය පොදු සම්මත රීති පද්ධතිය *'ෂරියා'* යන්නෙන් අදහස් කරයි. *ෂරියා* හුදෙක් නෛතික මූලධර්ම සහ සම්මතයන්ගෙන් වඩා ඔබ්බට අදාලවන නමුත්, නීතිමය ලෙස එය අදාලකර ගැනීමේදී බොහෝවිට **'ඉස්ලාමීය නීතිය'** යනුවෙන් හඳුන්වයි. ඉස්ලාමීය නීතියට පුළුල් පරාසයක නීතිමය අංග අන්තර්ගතවන අතර මුස්ලිම් පවුල් /පෞද්ගලික නීතිය යනු ලෝකයේ විවිධ රටවල් 44ක පමණ විවිධාකාරයෙන් ක්‍රියාත්මකවන ඉස්ලාමීය නීතියෙහි වඩාත් පොදු එක් අංගයක් පමණි. මැලේසියාව, ඉන්දුනීසියාව, මොරොක්කෝව, ටියුනීසියාව ඇතුළු රටවල් බොහොමයක මුස්ලිම් පවුල් නීතිය බහුවිධ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලින්ට ලක්වී ඇත්තේ

---

[1] ශ්‍රී ලංකාවේ සාමාන්‍ය විවාහ ආඥාපනත - - http://srilankalaw.lk/Volume-V/marriage-registration-ordinance.html
[2] 1907 අංක 19 දරණ සාමාන්‍ය විවාහ ආඥාපනතේ දීර්ඝ නාමය
3ජනගහණ හා නිවසා සංඛ්‍යාලේඛන 2012.

අදාල රටෙහි ජීවත්වන මුස්ලිම් ප්‍රජාවන් විසින් මුහුණ දෙන සමකාලීන ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීම සඳහායි.

ද්විත්ව නෛතික ක්‍රමයන් ස්ථාපිත රටවල ෂරියා නීතිය මුලිකවම පවුල් නීතියට අදාලවන කරුණු වෙත සීමා කිරීම (එනම් විවාහය, දික්කසාදය, භාරකාරත්වය, නඩත්තු, උරුමය), 19 වන ශතවර්ෂය අගභාගයේදී සහ 20 වන ශතවර්ෂය මුල් භාගයේදී සිදුවුවක් වන අතර එය යටත්විජිතභාවයේ බලපෑමක් ලෙස දැක්විය හැකිය.

ශ්‍රී ලංකාවේද යටත්විජිත සමයෙන් එසේ ඉතිරිවුවක් වන්නේ සාමාන්‍යයෙන් සියලුම පුරවැසියන් සඳහා අදාලවන පොදු සහ වඩාත් ලෞකික නීතියට සමාන්තරව, නිශ්චිත ප්‍රජාවක් වෙනුවෙන් අදාලවන පෞද්ගලික නීති ආදී වු "ස්වදේශීය නීති" දිගටම පවත්වාගෙනයාමයි. විවාහ සහ දික්කසාද පිළිබඳව සැලකීමේදී මුස්ලිම් සහ උඩරට සිංහල ප්‍රජාව සඳහා විවාහ (සාමාන්‍ය) ලියාපංදිචි කිරීමේ ආඥාපනතට අමතරව, පෞද්ගලික නීතිද පැවතීම මෙහි ප්‍රතිඵලයකි.

## 3 මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතෙහි පාලනය සහ ක්‍රියාත්මක කිරීම සිදු වන්නේ කෙසේද?

මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත මඟින් කාතිවරුන්ගේ මණ්ඩලයක් සහ උපදේශක මණ්ඩලයක් ඇතුළුව, කාති (මුස්ලිම් විනිසුරුවරයෙකු) අධිකරණ පද්ධතියක් ස්ථාපිතකර තිබේ. ශ්‍රී ලංකාවේ කාති අධිකරණ 65ක් තිබේ, මුස්ලිම්වරුන් මිලියන 20 ආසන්න ජනගහනයකට සේවය කිරීම සඳහා එක් කාතිවරයකු සහිතව. බොහෝමයක් කාතිවරුන්ට භූගෝලීය වශයෙන් අධිකරණ බල ප්‍රදේශයක් ඇති නමුත්, මෙමොන් ප්‍රජාව සඳහා වු කාති ආදී සමහර කාතිවරුන් සඳහා මෙමොන් ප්‍රජාවේ සාමාජිකයින් ජීවත්වන ඕනෑම ප්‍රදේශයකට බලපැවැත්වෙන පරිදි, දීප ව්‍යාප්ත ජනවාර්ගික අධිකරණ බලතල ඇත. පුත්තලම දිස්ත්‍රික්කයේ සියලුම අභ්‍යන්තරව අවතැන්වු පිරිස් සඳහා විශේෂ කාතිවරයෙක් පත්කර තිබුණි.

කාති මණ්ඩලය පිරිමි සාමාජිකයින් පස්දෙනෙකුගෙන් සමන්විතවන අතර ඔවුන් විසින් කාති අධිකරණ තීන්දු හෝ නඩු කටයුතු පිළිබඳව ඇපැල් අධීක්ෂණය කිරීම සිදු කරයි. කාති මණ්ඩල විසින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත පරිපාලනයට අදාලව හෝ ඒ ආශ්‍රිත නියාමනයන්හි මුස්ලිම් නීතිය පිළිබඳව ඇතිවිය හැකි ඕනෑම ගැටළුවක් සඳහා පැහැදිලි කිරීම් ලබා දෙයි. කාති මණ්ඩල නඩු විභාග කිරීම සිදු කරන්නේ කොළඹ සහ කල්මුණේ ප්‍රදේශයන්හි පමණි. මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ක්‍රියාත්මකව පැවති සමස්ත කාලය තුළම, පනත ප්‍රකාරව ඇති උපදේශන මණ්ඩලය කිසිදිනක ස්ථාපිතකර නොමැත.

## 4 කාති අධිකරණ සහ සිවිල් අධිකරණ අතර ඇති සම්බන්ධතාව කුමක්ද?

නඩු නොවිසඳී ඇති අවස්ථාවලදී හෝ කාති මණ්ඩලය විසින් ලබාදී ඇති තීරණයෙන් පාර්ශවයන් තෘප්තිමත් වන්නේ නැතිනම් - එවැනි නඩු අභියාචනාධිකරණයේදී අසනු ඇත. තවද මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ප්‍රකාරව, දෑවැද්ද (*මහාර් සහ කෛකූලි*) සඳහාවන හිමිකම්හි මුදල් අයකරගැනීම් පහසුකරණය සහ නඩත්තු ගෙවීම් පැහැරහැරීම පිළිබඳ බලාත්මක කිරීමේ නියෝග ලබාදීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට බලය ඇත. දිස්ත්‍රික් උසාවියට අදාල අධිකරණ බලය ඇත්තේ ළමා භාරකාරත්වය සම්බන්ධයෙන් පමණි.

## 5 කාති පත්කිරීම් අධීක්ෂණය කරනු ලබන්නේ කවුරුන්ද?

අධිකරණ සේවා කොමිෂන් සභාවට කාතිවරුන් පත්කිරීමේ බලය ඇත. ඒ සඳහා පත්කරනු ලබන්නේ ඕනෑම "චරිතවත් හා හොඳ තනතුරක් දරන සහ සුදුසු හිමිකම් සහිත මුස්ලිම් පුරුෂයෙකි. තවද, කාතිවරුන්ගේ සහ කාති මණ්ඩල සාමාජිකයින්ගේ සේවය අවසන් කිරීමේ හා ස්ථාන මාරු කිරීමේ බලතල ඇත. අධිකරණ සේවා කොමිෂන් සභාවට අනුව කාතිවරුන් තෝරාගනු ලබන්නේ

සාර්ථකත්වයන් 40ට අනුකූලවය: ඔවුහු නීතීඥවරු, මෞලවීවරු හෝ අලම් (ආගමික විද්වතා), විශ්‍රාමලත් මාණ්ඩලික ශ්‍රේණියේ රජයේ නිළධාරීන්, සහ/හෝ උපාධිධාරීන් විය යුතුය. අධිකරණ සේවා කොමිෂන් සභාවට කාතිවරුන් සම්බන්ධයෙන් ඇති පැමිණිලි පිළිබඳව ක්‍රියාමාර්ග ගැනීමේ වගකීමද ඇති නමුත්, පැමිණිලි විභාග කිරීමට හා කාතිවරුන්ගේ සේවය අවසන් කිරීම / ස්ථාන මාරු කිරීමට පමණක් බලය ඇත.

## 6 මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත සම්බන්ධයෙන් ඇති ප්‍රධාන ගැටළු මොනවාද?

මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත මඟින් මුස්ලිම් කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංගනය කිරීම සහ යුක්තියට, නිසි ක්‍රියාදාමයන්ට හා සහන සඳහා ප්‍රවේශය සීමා කිරීම දැඩි ලෙස සැලකිලිමත්විය යුතු කරුණු කිහිපයකි. මේ සඳහා පනතේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් මෙන්ම කාති උසාවිය හරහා ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවට නැංවීමේ සිදුවන ප්‍රායෝගික ගැටළුද ඇතුළත් වේ.

***අයිතිවාසිකම් දැඩි ලෙස උල්ලංගනයවීම් සම්බන්ධ මෙම සමහර ගැටළු වනුයේ (අනෙක් ඒවා අතුරින්):***

1 මුස්ලිම්වරුන්ට විවාහය සඳහා අවම වයස අවුරුදු 18 ලෙස ස්ථාපිත නොකිරීමෙන් නෛතික වශයෙන් ළමා විවාහ සඳහා ඉඩ ලබාදීම. (වයස අවුරුදු 12ට අඩු ළමයෙකුගේ විවාහයකට පවා කාතිවරයෙකුට අනුමැතිය දිය හැකිය.)
2 මනාලියගේ කැමැත්ත අනිවාර්ය (හා ලිඛිත) අවශ්‍යතාවක් නොවීම.
3 කාන්තාවන්ට හා පුරුෂයින්ට දික්කසාදය සඳහා වෙනස් ආකාරයේ කොන්දේසි.
   - හේතුවක් නොමැතිව ඒක පාර්ශවීය දික්කසාදවීමේ අයිතිය ස්වාමිපුරුෂයින්ට පමණක් ලබාදීම.
   - භාර්යාවන් සඳහා දීර්ඝ වු දික්කසාදවීමේ ක්‍රියාවලිය - හේතු හා සාක්ෂි, සාක්ෂිකරුවන් හා නඩු විභාගකිරීම් ආදිය අවශ්‍යවන.

4 කාති මත පදනම්ව භාර්යාවට හා දරුවාට නඩත්තු ප්‍රතිපාදන අත්තනෝමතිකව ලබාදීම.
5 භාර්යාව/න් හෝ අනාගත භාර්යාවගේ අනුමැතිය සඳහා අවශ්‍යතාවක් නොමැතිව මෙන්ම ස්වාමිපුරුෂයාට නඩත්තු කළ හැකිද යන්න තහවුරු නොකර බහුවිවාහ සිදු කිරීම.
6 සුදුසුකම්ලත් කාන්තාවන්ට විවාහ රෙජිස්ට්‍රාර්වරියන්, කාතිවරියන්, ජූරි සභිකයින් හෝ කාති මණ්ඩල සාමාජිකාවන් වීමට අවසර නැත. කාති තනතුර රජයේ වැටුපක් ලබන හා බදු අරමුදලින් පවත්වාගෙන යනු ලබන තනතුරක්වන අතර හුදෙක් ස්ත්‍රී පුරුෂ පදනම මත කාන්තාවන්ට වෙනස්කොට සැලකීම සඳහා අවසර ලබාදෙයි.
7 කාතිවරුන් සඳහා අනිවාර්යයෙන් සපුරාලියයුතු සුදුසුකම් හෝ පුහුණු නොමැත.

මුස්ලිම් කාන්තාවන්ගේ යුක්තියට ඇති ප්‍රවේශය කාති උසාවි තුළ දැඩි ලෙස සීමා වේ. පීඩාවට පත් කාන්තාවන් විවිධ අවස්ථාවන්හිදී පවසා ඇත්තේ sub-par කාති අධිකරණ පද්ධතිය මඟින් වෙනස්කොට සැලකීමට භාජනයවන බවයි. මෙය සිවිල් අධිකරණ පද්ධතියෙන් බොහෝ සෙයින් වෙනස්වන අතරම අගතියටපත් පාර්ශවයට නීතිමය නියෝජනයක් ලබා ගැනීමට ඉඩ සලසන්නේ නැත. උසාවියේ අදක්ෂ කාතිවරුන් හා ජූරි සභිකයින් විසින් බොහෝ විට කාන්තාවන්ට නිසි ලෙස සලකන්නේ නැත; ඔවුන්ගේ ස්වාමිපුරුෂයන්ට මෙන් සමාන සැලකිල්ලක් නොලැබේ; ඔවුන්ගේ නඩු ක්‍රියාවලිය පුරාවට උසාවියේදී වාචික අපයෝජනයට, තර්ජනයට හා අවමන් කිරීමට ලක්වීමේ බියෙන් තොරව තමන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමට හැකියාවක් නැත. බොහෝ අවස්ථාවන්හිදී කාතිවරුන් විසින් අත්තනෝමතිකව පුරුෂ පාර්ශවයෙන් පමණක් හෙබි ජූරි සභිකයින් (සුදුසුකම් නොමැති) තෝරාපත් කරනු ලබයි.

## 7 මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ප්‍රතිසංස්කරණයට ගෙනඇති උත්සාහයන් මොනවාද?

ආදිතම ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් 1954 වර්ෂය දක්වා දිවයන නමුත්, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සැලකිය යුතු ශක්තියක් ලබා ගත්තේ 1980 මැද භාගයේදීය. සුවිශේෂී සංශෝධනයන් වන්නේ, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කාතිවරුන් පත් කිරීමේ 1964 සංශෝධනයයි. පසුගිය වසර කිහිපය තුළ විවිධ කණ්ඩායම් විසින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතෙහි විවිධ කොටස් ප්‍රතිසංස්කරණය සඳහා ඉස්මතුකර ඇත.

නීති ප්‍රතිසංස්කරණය සඳහා කමිටු ගණනාවක් පිහිටුවා ඇති අතර ආරම්භක කමිටුව වන්නේ චාරිත්‍රානුකූල නීති ප්‍රතිසංස්කරණය සඳහා වු 1956 පොදු කමිටුවයි. එමඟින් ඒකාකාර සිවිල් සංග්‍රහයක් පිළිබඳ විකල්පක් සලකාබලනු ලැබුවද, එය මුස්ලිම් ප්‍රජාවගේ බොහෝ විරෝධතාවන්ට බඳුන් විය.

පසුකාලීනව විශේෂයෙන් මුස්ලිම් පවුල් නීතිය ප්‍රතිසංස්කරණයට අදාලව කමිටු පිහිටුවන ලදී:

1. 1970 - ආචාර්ය එච්. එම්. ඉසෙඩ්. ෆාරුක් විසින් හොබවන ලද කමිටුව මඟින් ප්‍රතිසංස්කරණය සඳහා ලබාදුන් නිර්දේශයන් අතරට, විවාහය සඳහා අවම වයස වැඩි කිරීම ඇතුළුව මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට හරයාත්මක හා පටිපාටිමය සංශෝධනයන් ඉදිරිපත් විය;

2. 1984 - කමිටුවක් ස්ථාපිත කරන ලද නමුත් නිශ්චිත ප්‍රගතියකින් තොරව එය විසුරුවා හරින ලදී;

3. 1990 - ආචාර්ය ඒ. එම්. එම්. ශහබ්ඩීන් විසින් හොබවන ලද කමිටුවක් ස්ථාපිත කරන ලදී. එය මෙතෙක් පැවති වඩාත්ම සාර්ථක කමිටුව ලෙස දැක්විය හැක්කේ වසර දෙකක කාලයක් තුළදී වාර්තාවක් සකස්කර එය රජයට භාරදීමට හැකිවීම නිසාවෙනි. ව්‍යවස්ථාදායක ක්‍රියාකාරීත්වය අවමවීම හේතුවෙන් ක්‍රියාවලිය නතරවුයේ, මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට අදාල ප්‍රතිසංස්කරණ එම වකවානුවේදී මුස්ලිම් නායකයින්ට හෝ රජයට දේශපාලනික ප්‍රමුඛතාවක් නොවීම නිසාවෙනි;

4. 2005 - මුස්ලිම් කාන්තා පර්යේෂණ සහ ක්‍රියාකාරීත්ව සංසදය (Muslim Women's Research and Action Forum - MWRAF) විසින් මුස්ලිම් පෞද්ගලික නීති ප්‍රතිසංස්කරණයට ස්වාධීන කමිටුවක් සඳහා මුලපුරන ලදී. එම කමිටුව දීපව්‍යාප්තව විවිධ ක්‍රියාදරයන්ගේ අදහස් විමසීමෙන් අනතුරුව නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සකස් කරන ලදී. එම වාර්තාව 2009 කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවට මුලික ලේඛණය මෙන්ම පූර්වාදර්ශයක්ද විය;

5. 2009 - එවකට අධිකරණ අමාත්‍යවරයා වු මිලින්ද මොරගොඩ මහතා විසින් සාමාජිකයින් 16 දෙනෙකුගෙන් සමන්විත මුස්ලිම් පවුල් නීතිය ප්‍රතිසංස්කරණයට කමිටුවක් ස්ථාපිත කරන ලදී. හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකු වු ජනාධිපති නීතීඥ සලීම් මර්සූෆ් මහතා එහි සභාපති ලෙස කටයුතු කරයි. මෙම කමිටුව විසින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතට අදාල ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ අධිකරණ අමාත්‍යවරයා වෙත භාරදීමට නියමිතය.

## 8 2009 ප්‍රතිසංස්කරණ කමිටුව පත් කළේ ඇයි? එහි සාමාජිකයින් කවුරුන්ද?

2009දී එවකට අධිකරණ අමාත්‍යවරයා වූ මිලින්ද මොරගොඩ මහතා විසින් කීර්තිමත් මුස්ලිම් පුද්ගලයින් කිහිපදෙනෙකු සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව මුස්ලිම් පෞද්ගලික නීතියට යම් ප්‍රතිසංස්කරණ "ඉතා ඉක්මණින් අවශ්‍ය බවට" පිළිගන්නා ලදී. ඔහු විසින් ජ්‍යේෂ්ඨ නීතිඥවරුන්, සමස්ත ලංකා ජමෙයිතුල් උලෙමාහි ප්‍රධානීන්, අධ්‍යාපනඥයින් සහ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයින්ගෙන් සැදුම්ලත් 16 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් ස්ථාපිත කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබාගන්නා ලදී.

කමිටුවේ දැනට සිටින සාමාජිකයින් වන්නේ:

1. **විනිසුරු සලීම් මර්සූෆ්,** ජනාධිපති නීතිඥ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු
2. **ඩිල්හාරා අමරසිංහ මෙනවිය**, හිටපු අතිරේක ලේකම් **(කමිටුවෙහි සම ලේකම්)**
3. **විනිසුරු ඇබ්ඩස් ඩබ්ලිව් සලාම්,** අභියාචනාධිකරණ විනිසුරු
4. **විනිසුරු මොහොමඩ් මැකී,** දිසා විනිසුරු, අධිකරණ සේවා කොමිෂන් සභාවෙහි හිටපු සහකාර ලේකම්
5. **ශිබ්ලි අසීස් මහතා,** ජනාධිපති නීතිඥ, හිටපු නීතිපති
6. **ෆයිස් මුස්තාෆා මහතා,** ජනාධිපති නීතිඥ, හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂක නඩු පැවරීම්
7. **මහාචාර්ය ෂරියා ශැරෙන්ගුවෙල්,** විධායක අධ්‍යක්ෂිකා, මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය
8. **ආචාර්ය එම්. ඒ. එම්. ෂුක්රි,** හිටපු අධ්‍යක්ෂක, ජමියා නලීමියා
9. **අෂ්-ෂික් මොහොමඩ් මැග්ඩූම් අහ්මඩ් මුබාරක්**, හිටපු සභාපති ජමෙයිතුල් උලමා
10. **අෂ්-ෂික් මොහොමඩ් බ්‍රාහීම් මොහොමඩ් රිස්වි මුෆ්ති**, සභාපති ජමෙයිතුල් උලමා
11. **දේශබන්දු ජෙසීමා ඉස්මයිල් මහත්මිය**, ජාතික කාන්තා කමිටුවෙහි සහ මානව හිමිකම් කොමිසමෙහි හිටපු සාමාජික
12. **සෆානා ගුල් බේගුම් මහත්මිය**, නීතිඥ
13. **ෆස්ලට් ශහබ්දීන් මහත්මිය,** නීතිඥ
14. **රස්මාරා ආබ්ඩීන් මහතා,** නීතිඥ
15. **නඩ්වි බහුඩීන් මහතා**, ජාතික සභාපති, තරුණ මුස්ලිම් සංගමය
16. **ෆර්සානා ජුරම්පති මෙනවිය,** මුස්ලිම් කාන්තා විද්‍යාලයේ හිටපු විදුහල්පතිනිය

## 9. ව්‍යවස්ථාවෙහි අංක 16 (1) වගන්තිය සමාලෝචනය කිරීම හා MMDA ප්‍රතිසංස්කරණය කිරීම අතර ඇති සම්බන්ධතාවය

වගන්ති අංක 16 (1) 1978 ශ්‍රී ලංකා ව්‍යාවස්ථාවේ අඩංගු මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයකි. 1978 ව්‍යවස්ථාවට පෙර පැවති ලියා ඇති සහ නොමැති සියලුම නීතිමාලාවන් වලංගු සහ ක්‍රියාත්මකව ප්‍රකාශ කර තිබේ. ඉන් පිලිඹිබු වන්නේ මෙම නීතිමාලාවන් පවත්නා මූලික අයිතිවාසිකම් තිබුණත් ඒවාද වලංගු බවය. පවත්නා ව්‍යවස්ථාවෙහි අන්තර්ගත වගන්ති අංක 16 (1) සමානාත්මතාවය (වගන්ති අංක 12(1)) සහ වෙනස්කොට නොසැලකීම (වගන්ති අංක 12(2)) අවලංගු කිරීම සහතික කරයි. එයින් කියනු ලබන්නේ ලේඛනගත කර ඇති හෝ නොමැති සියලුම නීති ද MMDA ද ඇතුලුව පුද්ගලයෙකුගේ මූලික අයිතිවාසිකම් උල්ලංගනය කිරීමක් සිදුකරයි. එය අධිකරණ නීතියට අනුව අභියෝගයට ලක් කල නොහැකිය.

- නව ව්‍යවස්ථාව දේශයේ උත්තරීතර නීතිය වශයෙන් සම්මත වීමට නම වගන්ති අංක 16 (1) සමාලෝචනය විය යුතු අතර තම ආගම හෝ ජාතිය මත පදනම් නොවූ මූලික මිනිස් අයිතිවාසිකම් සහ ස්ත්‍රීපුරුෂභාවිය සමානාත්මතාවයෙන් යුතු නෛතික පරිසරයක් සියලුම පුරවැසියන් හට ලබාදීම;

- වගන්ති අංක 16(1) නොමැතිකම - පවත්නා ක්‍රියාපිලියෙහි සහ MMDA හි වලංගුභාවය මත හෝ අනෙක් 600 කට වැඩි නීතිපද්ධතියට එසැනින් බලපෑම් ඇති කිරීමට නොහැකිය. ශ්‍රී ලංකාව තුල ජීවත් වන මුස්ලිම් ප්‍රජාට පවත්නා MMDA ක්‍රමවේදයන් සහ අනෙක් පෞද්ගලික නෛතික නීතීන් තුල රැකිය හැකිය. එසේ කිරීමේදී ප්‍රජාව විසින්ම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වටපිටාවක් ගොඩනැගෙනු ඇත. නව ව්‍යාවස්ථාව ප්‍රසිද්ධ කිරීම තුලින් නීති ප්‍රතිසංස්කරණ කොමිසමක් ස්ථාපිත

කර ඇති බවත් වසර දෙකක කාලයක් ඇතුලත එම නව ව්‍යාවස්ථාව තුල ඇති නීති හේතුවෙන් සිදුවන වෙනස්වීමට හඳුනාගැනීමට සහ නිර්දේශයන් ලබාදීමට මෙම කොමිසම තුලින් බලාපොරොත්තු වන බවත් නිර්දේශ කොටඇත.ත

මෙම නිරීක්ෂණ කාලයෙන් පසුව, එක් පුද්ගලයෙකු හෝ MMDA හි බලපෑමකට විරුද්ධව ඇයගේ/ ඔහුගේ පුරවැසි මූලික අයිතිවාසිකම් කඩකිරීමක් සිදුවුවහොත්, එම පුද්ගලයාට - ශ්‍රී ලංකික පුරවැසියකු ලෙස - සිදුවූ අගතිය ඔහු/ ඇයගේ කැමැත්ත අනුව නීත්‍යානුකූල හෝ උත්තරීතර උසාවියට යොමු කල හැක;

MMDA ප්‍රතිසංස්කරනය මුස්ලිම් පුරවැසියාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් නොවන්නේ නම් ඔවුනට වගන්ති අංක 16(1) ට විශාල අවධානයක් යොමු කල යුතු නොවේ.  එනමුත්, වෙනස්කොට සැලකීමක් දක්නට ලැබේ නම් - වගන්ති අංක 16(1) විකල්ප නීති පිළියමක් ලෙස මුස්ලිම් කාන්තාවන්ගේ, පිරිමි සහ ළමුන්ගේ විවාහ සහ දික්කසාද ගැටළු සඳහා, අනෙක් පුරවැසියන් සේම උපයෝගී කරගත හැකිවේ.